# Journal of Intangible Cultural Heritage

JICH (2026), Volume 5 (I)

## A Study on the Etymology and Usage of the Term "Maṇḍiya" in Local Folklore

M. S. E. Peiris[1], W. V. P. H. Ranaweera[2,3], P. P. R. Perera[1,4]

[1]Faculty of Graduate Studies, University of Sri Jayewardenepura, Sri Lanka, [2]Department of, Languages, Cultural Studies and Performing Arts, University of Sri Jayewardenepura, Sri Lanka, [3]International Center for Interdisciplinary Studies, University of Sri Jayewardenepura, Sri Lanka, [4]Department of Biochemistry, Faculty of Medical Sciences, University of Sri Jayewardenepura, Sri Lanka.

** himalika@sjp.ac.lk*

## *Abstract*

*This research paper explains the etymological background, as well as the meanings associated with the term 'Maṇḍiya', while also investigating the equivalencies that occur when comparing the use of this term across different contexts. A qualitative research approach, ideal for the ethnographic study of folklore, was used to gather data through face-to-face interviews with language experts and folklore specialists. They were selected using judgmental sampling and snowball sampling methods. Secondary sources were also consulted, including lexicons in the Sinhalese and Tamil languages, as well as pre-existing literature. A thematic analysis was conducted using an inductive method to examine the data. It was found that "Maṇḍiya" is used in folk language to refer to a particular posture in a dance form, a certain type of rock, geographical locations, solutions or liquids, collective nouns, and as an affix in place names. There seems to be an etymology to it, with it being derived from the Tamil word "Maṇḍiya", which means to bend the knees, and having developed to refer to correspondences related to circular placement or sinking at the bottom. The conclusion of the research states that "Maṇḍiya" is a technical word representing a basic movement (aṁgahāra) in native dance, as well as a diverse folk representation of collectiveness and geographical awareness illustrated through various native concepts such as "Kamath Maṇḍiya", "Gam Maṇḍiya", and "Væ Maṇḍiya", referring to threshing floor areas, village centres, and areas around tanks, respectively. This research also examines "Maṇḍiya" as a linguistic compound word. This amalgamation of dispersed knowledge brings forth a new avenue for research on native linguistic concepts, dance forms, and folklore.*

**Key Words:** *Affix, Folklore, Dance, Etymology, Functional Usage, Maṇḍiya*

## 1. හැඳින්වීම

එකිනෙකා අතර සන්නිවේදනය සඳහා අප විසින් පරිහරණය කරනු ලබන ප්‍රබලතම මාධ්‍යය භාෂාව යි. දියුණු භාෂාවක කථා ව්‍යවහාරය සහ ලේඛන ව්‍යවහාරය යනුවෙන් ප්‍රධාන ප්‍රභේද දෙකක් හඳුනා ගත හැකි ය. සිංහල භාෂාවේ ද මෙම ව්‍යවහාර දෘක ගත හැකි අතර කථා ව්‍යවහාරය හැඳින්වීම සඳහා 'කට වහර' යන යෙදුමත්, ලේඛන ව්‍යවහාරය හඳුන්වනු සඳහා 'ගත් වහර' යන යෙදුමත් භාවිත කරයි (දිසානායක, 2000). මෙම විමර්ශනය සිංහල කට වහර හා බැඳුණු අධ්‍යයනයකි. සිංහල කට වහරෙහි ද අපට නොයෙකුත් ප්‍රභේද හඳුනා ගත හැකි ය. එබඳු එක්

බෙදීමකි; 'වියත් වහර' හා 'ජන වහර' යනුවෙන් දක්වෙනුයේ. කතා බහේ දී වියත් වහර භාවිත කරන්නෝ වියත්හු ය. එසේ ම කතා බහේ දී 'ජන වහර' උසුරුවනු ලබන්නේ පොදු ජනයා විසිනි (දිසානායක, 2000).

ජන ව්‍යවහාරය හෙවත් ජන භාෂාව ජනශ්‍රැතියේ වැදගත් අංගයකි (රත්නපාල, 2010). අධ්‍යයන ප්‍රස්තුතයට අදාළ "මණ්ඩිය" යෙදුම ජන ව්‍යවහාරයෙහි යෙදී ඇති අවස්ථා සහ භාවිතාර්ථ විමසීමේ දී ඒ හා බැඳී පවත්නා ජනශ්‍රැති ද හඳුනා ගත හැකි විය. නර්තනයේ ද යෙදෙන ශරීර ඉරියවුවක් හැඳින්වීම, පාෂාණ වර්ග හැඳින්වීම, ප්‍රදේශාර්ථය හැඟවීමේ පදයක් ලෙස, ද්‍රවයක බර කොටස පහළින් තැන්පත් වීම ආශ්‍රිත ව්‍යවහාර සඳහා, සමූහාර්ථයක් හඟවන පදයක් ලෙස මණ්ඩි හා ග්‍රාමනාමයක දී අපර පදයක් ලෙස ද මණ්ඩි වචනය යෙදීම ආදි වශයෙන් ක්ෂේත්‍ර ගණනාවක විහිදුණු ජනශ්‍රැතියක්, ජන ව්‍යවහාර සමුච්චයක් හෙළිදරවු කර ගැනිණි.

Alan Dundes (1965) නම් ජනශ්‍රැති පර්යේෂකයා පෙන්වා දෙන ආකාරයට "ජනශ්‍රැතිය යනු, මුඛ පරම්පරාගතව කාලයක් තිස්සේ පැවත එන සාමූහික දැන නුවණ යි. ජනශ්‍රැතිය තේරුම් ගත යුත්තේ එය ඇති වූ සැටිත්, මිනිස් සමූහයා විසින් එය ප්‍රයෝජනයට ගන්නා සැටිත්, ව්‍යාප්ත වන සැටිත් සලකා බලමිනි" (උද්ධෘතය, රත්නපාල, 2010, 21). එම විග්‍රහය මත පදනම් ව බලන විට, වර්තමානයේ දී පවා "මණ්ඩිය" යෙදුම ජන ව්‍යවහාරයෙහි ප්‍රයෝජනයට ගන්නා ආකාරයෙන්, සාමූහික විඥානය තුළ සක්‍රීය ව පවත්නා බව තහවුරු කර ගත හැකි විය.

'මණ්ඩිය' යන යෙදුම மண்டி යන දමිළ පදයේ තත්සම ව සිංහලයට ගළපා ගත් නාමපදයකි (එස්. ජේ. යෝගරාජා, ස.සා, 05.20.2025). එසේ වුව ද, 'මණ්ඩිය' යන යෙදුම දමිළයෙහි භාවිත කරන නිරුක්ත්‍යර්ථයන්ගෙන් පරිබාහිරව දේශජ ඌරුවකින් සකසා ගත් භාවිතාර්ථයන්ගෙන් පෝෂණය කරවා ගන්නට සිංහලයා සමත් ව ඇත. දේශීය ජන ව්‍යවහාරයෙහි 'මංඩිය' 'මණ්ඩිය' 'මැණ්ඩිය' ආදි වශයෙන් ලේඛනගතව සහ කට වහරෙහි විවිධාර්ථ සහ අවස්ථා මතු කර දක්වීම සඳහාත් විවිධ සමාජ - සංස්කෘතික වපසරිවල දී සුවිශේෂී අර්ථ සම්පාදනය කෙරෙන නාමපදයක් ලෙසත් භාවිත වේ. වෙනත් විෂය ක්ෂේත්‍රවලට සාපේක්ෂ ව දේශීය නර්තන කලාව හා තදාත්මික ව ව්‍යවහාර කෙරෙන යෙදුමකි, මණ්ඩිය. උඩරට, පහතරට හා සබරගමු නර්තන සම්ප්‍රදායත්‍රයේ ම මූලික ඉරියවුව ද මේ නමින් හැඳින්වේ. මේ අනුව බලන කල; "මණ්ඩිය" යන වදන හා බැඳී පවතින දේශීය ජන ව්‍යවහාර සහ ජනශ්‍රැති රාශියක් විසිරී පවතින බවත්, ඒ පිළිබඳ ව නිසි අධ්‍යයනයක් සිදු වී නොමැතිකමින්, නොසලකා හැරීම සහ අනවධානය හේතු කොටගෙන මණ්ඩිය යන වචනයෙහි පැරණි භාවිතාර්ථ අද්‍යතන භාවිතයෙන් බොහෝ සෙයින් දුරස්ථව ගොස් ඇති බවත් පෙනේ. මෙකී පර්යේෂණමය හිඩැස සපුරාලමින් දේශීය ජන ව්‍යවහාරයෙහි භාවිත මණ්ඩිය පිළිබඳ නිරුක්ත්‍යර්ථ සහ භාවිතාර්ථ මොනවාදැයි මෙම අධ්‍යයනයෙන් ප්‍රධාන ලෙස ම පරීක්ෂා කෙරිණි. අධ්‍යයන අරමුණු වූයේ මණ්ඩිය යන වචනයෙහි නිරුක්ත්‍යර්ථ හඳුනා ගැනීම, මණ්ඩිය යන ව්‍යවහාරය දේශීය සංස්කෘතියෙහි නිරූපණය වන අවස්ථා හඳුනා ගැනීම හා මණ්ඩිය යන ව්‍යවහාරය විවිධ ප්‍රස්තුතවල යෙදීමේ දී ගොඩනැඟෙන අනුරූපීතා අධ්‍යයනය කිරීම යි.

"මණ්ඩිය" වදන සාමාජීය හා සංස්කෘතික කරුණු කාරණා ඉස්මතු කරවාලන අගනා ජනශ්‍රැති සම්ප්‍රදායක් හා බැඳී පවතින්නකි. ඒ මගින් අතීත ජනයාගේ සිතුම් - පැතුම්, අදහස් - ආකල්ප, විශ්වාස හා ඇදහිලි ආදි වශයෙන් වූ ජන විඥ්ඥාණය මනා ව පිළිබිඹු වේ. මෙම අධ්‍යයනය මඟින් "මණ්ඩිය" වචනය සමඟ මුසු ව පවත්නා ජන ව්‍යවහාර/ ජනශ්‍රැති එකතු කිරීම, වර්ගීකරණය කිරීම, ජනශ්‍රැති සංරක්ෂණය, දැනුම සම්පිණ්ඩනය කිරීම සහ විග්‍රහ කිරීම විද්‍යාත්මක ක්‍රමවේදවලට අනුව රැස් කෙරෙන අතර එමඟින් ඉතා වැදගත් සහ විසිරී පැවති දැනුම රාශීභූත කිරීමත් සිදු ව ඇත.

අතීත ජනයාගේ සාමූහික විඥානය, පාරිසරික අවබෝධය සහ සමාජ කේන්ද්‍රීය ජීවන රටාව මැනවින් පිළිබිඹු කරමින්, දේශීය සංස්කෘතික අඛණ්ඩතාව පවත්වා ගැනීමට උර දෙයි. උඩරට, පහතරට සහ සබරගමු නර්තන සම්ප්‍රදාය ත්‍රිත්වයේ ම මූලික ඉරියවුව හැඳින්වීමට යෙදෙන "මණ්ඩිය" යන පදයෙහි නිරුක්තිමය පදනම සහ සාම්ප්‍රදායික විශේෂාංග පිළිබඳව ගැඹුරු විග්‍රහයක් සැපයීම තුළින් නර්තන වාග් කෝෂය තවදුරටත් පොහොසත් කිරීමට මෙම අධ්‍යයනය ඉවහල් වනු ඇත.

එසේ ම, මෙම පර්යේෂණය භාෂා විද්‍යාව, ජනශ්‍රැතිය, නර්තන කලාව, කෘෂිකාර්මික ඉතිහාසය සහ භූ විද්‍යාව වැනි විවිධ අධ්‍යයන ක්ෂේත්‍ර සඳහා ප්‍රාථමික මූලාශ්‍රයක් ලෙස භාවිත කළ හැකි මූලික දත්ත සමුච්චයක් සහ විග්‍රහයන් සපයයි. එපමණක් නොව, විවිධ අර්ථවල දී "මණ්ඩිය" වදනේ ඇති පොදු අනුරූපීතා හඳුනා ගැනීම මඟින්, සිංහල භාෂාව විසින් වෙනත්

භාෂාවකින් ලබා ගත් වචන දේශීය සංස්කෘතික භාවිතාවන්ට අනුකූලව අර්ථ විපර්යාසයට ලක් කර ගෙන ඇති ආකාරය පිළිබඳව භාෂා විද්‍යාත්මක විග්‍රහයක් ලබා දීමත් ආදි කරුණු කාරණා මෙම අධ්‍යයනයේ සුවිශේෂී වටිනාකම් ලෙස හුවා දැක්විය හැකි ය.

## 2. අධ්‍යයන ක්‍රමවේදය

මෙය දේශීය ජනශ්‍රැතිය හා සබැඳි මානවවංශ විධි විවරණයක් වන හෙයින් ක්ෂේත්‍ර අධ්‍යයනය යටතේ අභිසම්මුඛ සාකච්ඡා ක්‍රමය ජනශ්‍රැතිගත දත්ත ඒකරාශී කර ගැනීම සඳහා වඩාත් උචිත විධික්‍රමය ලෙස හඳුනා ගැනිණි (විජේසේකර, 2019). ''මණ්ඩි'' යන වචනාර්ථ හා නිරුක්ත්‍යර්ථ සම්පාදනය කර ගැනීමේ දී මූලික වශයෙන් සිංහල හා දමිළ කෝෂ ග්‍රන්ථ පරිශීලනය කෙරුණු අතර නර්තනය හා බැඳුණු අවස්ථා මෙන් ම මාතෘකානුබද්ධ තොරතුරු අනාවරණය කර ගැනීම සඳහා සාමාන්‍ය කියැවීම් කෘති පරිශීලනය කරන ලදි.

ඒ අනුව මූලික වශයෙන් ම ලිඛිත මූලාශ්‍රයත්, ක්ෂේත්‍ර අධ්‍යයනය යටතේ අභිසම්මුඛ සාකච්ඡා ක්‍රමයත් දත්ත රැස් කිරීමේ ලා උපස්තම්භක විය. ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී සම්මුඛ සාකච්ඡා සඳහා භාෂා ප්‍රවීණයන් දෙදෙනෙකු සහ ජනශ්‍රැති පර්යේෂකයන් දෙදෙනෙකු දත්ත දායකයන් ලෙස යොදා ගැනුණි. විනිශ්චය නියැදීම හා හිම බෝල නියැදීම යන ක්‍රම ද්වය ම උපයෝගී කර ගනිමින් රැස් කළ මෙම දත්ත, මණ්ඩිය හා බැඳි දේශීය ජන ව්‍යවහාර පිළිබඳ දත්ත ගවේෂණයේ දී වැදගත් වූ ප්‍රාථමික මූලාශ්‍රයක් විය. අන්තර්ජාල ලිපි සහ කෝෂ ග්‍රන්ථ ද්විතීයික මූලාශ්‍රය වශයෙන් පරිශීලනය කෙරිණි. රැස් කළ දත්ත, තේමා විශ්ලේෂණයට ලක් කෙරිණි. විශ්ලේෂිත තේමා ඔස්සේ සිදු කරන ලද අර්ථ දැක්වීම් මඟින් ප්‍රතිඵල ගොඩනගන ලදි.

සදාචාර අනුමැතිය
මෙම පර්යේෂණය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා සදාචාර කමිටුවේ (ERCHSS) අනුමැතිය සහිත ව (HSS/FGS/2025/01/03) සිදු කරන ලදි.

## 3. ප්‍රතිඵල හා සාකච්ඡාව

දත්ත විශ්ලේෂණයේ දී, පූර්ව හෝ අපර පදයක් ලෙස ''මණ්ඩි'' යන පදය විවිධ අවස්ථාවල භාවිත වනු නිරීක්ෂණය කළ හැකි විය. ඒ අනුව ප්‍රතිඵල පහත දැක්වෙන පරිදි වර්ගීකරණය කෙරිණිඃ

1. **නර්තන/ ශරීර ඉරියව්වක් හැඳින්වීම සඳහා මණ්ඩිය පදය යෙදීම.**
2. **පාෂාණ වර්ග හැඳින්වීමට මණ්ඩිය පදය යෙදීම**
3. **ප්‍රදේශාර්ථය හඟවන පදයක් ලෙස මණ්ඩිය පදය යෙදීම.**
4. **ද්‍රාවණ හෝ ද්‍රවමය අවස්ථා ආශ්‍රය කර ගනිමින් මණ්ඩිය පදය යෙදීම.**
5. **සමූහාර්ථයක් හඟවන පදයක් ලෙස මණ්ඩිය පදය යෙදීම.**
6. **ග්‍රාම නාමයක දී අපර පදයක් ලෙස මණ්ඩිය පදය යෙදීම.**
7. **මණ්ඩි වචනය සමාස නාමයක් ලෙස යෙදීම.**

ඉහත දක්වා ඇති ප්‍රභේදයනට අමතර ව ''මංඩිය'' ''මණ්ඩිය'' යන වදන් හා බැඳී පවත්නා වෙනත් ජන ව්‍යවහාර කිහිපයක් ද හඳුනා ගැනුණි.

### 3.1 නර්තන/ ශරීර ඉරියව්වක් හැඳින්වීම සඳහා මණ්ඩිය යන පදය භාවිතය.

මණ්ඩිය යන පදය ව්‍යවහාර වන ප්‍රධාන අවස්ථාවක් වන්නේ, නර්තන කලාව හා බැඳුණු මූලික අංගහාරයක් හැඳින්වීමට යි. උඩරට, පහතරට හා සබරගමු යන දේශීය නර්තන සම්ප්‍රදායවල මූලික ඉරියව්ව මණ්ඩිය ලෙස **නර්තන වාක් කෝෂයෙහි** සඳහන් කර ඇත (දිසානායක, 2021). එසේ ම ඒ ඒ සම්ප්‍රදායවලට අදාළ ව මණ්ඩියේ සුවිශේෂතා කිහිපයක් ද දක්වා ඇත.



**රූප සටහන 01** - *පහතරට මණ්ඩිය* (Harshana, 2025)

උඩරට නර්තන සම්ප්‍රදායට ආවේණික මණ්ඩි ඉරියවුව කන, වැලමිට සහ දණහිස සම තලයක පිහිටන සේ පූර්ණ සටයක් හෙවත් පිරුණු කළයක ස්වභාවයක් විද්‍යමාන වන ආකාරයෙන් ද සබරගමු නර්තන සම්ප්‍රදායට ආවේණික මණ්ඩි ඉරියවුව විග්ගුස්සක ප්‍රමාණයෙන් පා පරතරය පිහිටුවාගෙන සිටිය යුතු බව එහි දක්වා ඇත. එසේ ම පහතරට නර්තන සම්ප්‍රදායේ මණ්ඩිය කෙරේ අවධානය යොමු කරන විට ඉගටියෙන් පහළ කොටස දේශීය වෙනත් නැටුම්වල දී මෙන් පිහිටුවාගෙන, විශේෂයෙන් තට්ටම් කොටස පිටුපසට බර කර තබා ගත යුතු බව දිසානායක දක්වයි (2021). එහි ම තවත් තැනෙක ඒ ඒ නැටුම් සම්ප්‍රදායට අදාළ ව දෙ අත් හසුරුවා මණ්ඩියේ සිටීම "පූර්ණ මණ්ඩිය" ලෙස ද දක්වා ඇත (දිසානායක, 2021).

"දෙපා දැතට විහිදුවා අතර වියතක් පමණ තිබෙන සේ දනිස් දෙපසට යවා දෑතෙහි ඇඟිලි මුහුණට මුහුණ ලා සිටින සේ හරස්කඩය මත තබා වැලමිටෙන් නමා වැලමිටි කොන් දෙදණහිසට සමාන වන සේ කය ඍජුව පිහිටුවා" (සන්නස්ගල, 1992) සිටින නර්තන ඉරියවුවක් ලෙස **සිංහල ශබ්දකෝෂයෙහි** මණ්ඩිය යන පදයට දෙවැනි අර්ථය යටතේ නිරුක්ති සපයා ඇත. (මෙහි දැතට යනුවෙන් ශබ්දකෝෂයෙන් අදහස් කරනුයේ දෙපස විය හැකි ය.)

උඩරට නර්තන සම්ප්‍රදායේ වන්නම් නර්තනය කිරීමේ දී වන්නමේ ආරම්භක තානම සහ සෙසු කවි ගායනා කරන අවස්ථාවල දී දකුණු කකුල ඉදිරියට තබා, පහත් වී සිටින ඉරියව්ව 'ගී මණ්ඩිය' ලෙස හැඳින්වේ (ඩී. ගුණසේන, ස.සා., 11. 06. 2025). ගී මණ්ඩිය පහතරට හා සබරගමු නර්තන සම්ප්‍රදායවල දැක ගත නොහැකි වේ. එසේ ම ප්‍රායෝගික පක්ෂයේ දී තරමක් පොළොවට සමාන්තර වන ලෙස හොඳින් පහත් වී අදාළ නර්තන සම්ප්‍රදායේ මූලික හස්තය නිවැරදිව පවත්වා ගනිමින් සිටින ඉරියව්ව 'බර මණ්ඩිය' ලෙස ද ව්‍යවහාරයක් පවතී (ඩී. ගුණසේන, ස.සා., 11. 06. 2025). එපමණක් නොව ලම්භ මැණ්ඩි, මුලු මැණ්ඩි සහ අඩ මැණ්ඩි යනාදි වශයෙන් මණ්ඩියේ ප්‍රභේද තුනක් **පහතරට රංග කලාවේ ලේඛන රීතිය** කෘතියෙහි නාම මාත්‍රිකව දක්වා ඇත (කෝට්ටගොඩ, 2011).

**දෙමළ-සිංහල ආකාරාදියෙහි** 'මණ්ඩි' යන වචනයට නිරුක්ති අර්ථ 4ක් සපයා ඇත. ඉන් දෙවැන්න ලෙස දක්වාලන්නේ 'දණ නැමීම' යන අර්ථය යි. එහි ම மண்டிபோடு - யிடு (මණ්ඩිෆෝඩු - යිඩු) යන වචනය යටතේ ද පළමු අර්ථය වශයෙන් 'දණ නමනවා' යන අර්ථය ඉදිරිපත් කර ඇත (කරුණාතිලක, 2022). මෙහි දක්වාලන "දණ නැමීම" යන නිරුක්ත්‍යර්ථයෙන්, නර්තනය සඳහා දෙපා දෙපසට හරවා දණහිස් දෙපසට පිහිටුවා සිටීම ගම්‍ය කෙරේ (එස්. ජේ. යෝගරාජා, ස.සා, 05.20.2025).

දේශීය ජන ව්‍යවහාරයට එක් වූ නවාංගයක් ලෙසත් අන්තර් සංස්කෘතික පාරිභාෂික ශබ්දයක් ලෙසත් සලකා "අරමණ්ඩිය" වචනයෙහි භාවිතාර්ථ සහ නිරුක්ත්‍යර්ථ ද අපගේ පර්යේෂණයේ දී සලකා බැලිණි.

අර්ධමණ්ඩලි (Ardhamaṇḍalī) හෝ අරෙයිමණ්ඩි (Areyimaṇḍi) හෝ අරමණ්ඩි (Aramaṇḍi) යනු, දක්ෂිණ භාරතීය ප්‍රධාන නර්තන සම්ප්‍රදායක් වන භරත නාට්‍යම්හි භාවිත වන මූලික නර්තන ඉරියව්ව යි. නෘත්ත ලෙස වර්ගීකරණය කරන ලද භරත නාට්‍යම් නර්තන සියල්ල ම පාහේ අරමණ්ඩි ඉරියව්වෙන් සිදු කෙරේ. ද්‍රවිඩ බසින් 'අරෙයි' යනුවෙන් 'අර්ධයක්/ භාගයක්' වැනි අදහසක් ගම්‍ය වේ. 'මණ්ඩි' යන පදයෙහි සිංහලාර්ථය 'ඉඳ ගැනීම හෝ වාඩි වීම' වශයෙන් ගිනිය හැකි වේ. ඒ අනුව අර්ධ වශයෙන් වාඩි වී සිටින යන අදහස මෙමගින් ගත හැකි වේ. අරමණ්ඩි ඉරියව්ව 'උක්කරමන්ඩලී' ලෙස ද හැඳින්වේ (Vatsyayan, 1992). උක්කර් යනු, දමිළ බසින් හිඳ ගැනීම යන අර්ථය යි. අරමණ්ඩි ඉරියව්වේ දී, නර්තන ශිල්පියාගේ විලුඹ දෙක එකට එකතු වී දණහිස් දෙපසට යොමු වී ඇති අතර, කකුල් දෙකේ ඇඟිලි ද දෙපසට යොමු ව තිබිය යුතු ය. නිවැරදි සහ සම්මත අරමණ්ඩියක ඊට ම අනන්‍ය වූ ජ්‍යාමිතික ලක්ෂණයක් වේ. එහි දී නර්තන ශිල්පියාගේ සිරුරෙන් ත්‍රිකෝණාකාර හැඩ නිරූපණය වේ (Vatsyayan, 1992).

නටන විට දක්වන ඉරියව්වක්, නැටුම් ඉරියව්වක් ලෙස **ප්‍රායෝගික සිංහල ශබ්දකෝෂයෙහි** (විජයතුංග, 1984) සහ **නිරුක්ති සහිත සිංහල ශබ්දකෝෂයෙහි** මණ්ඩිය අරුත් ගන්වා ඇත. එසේ ම 'මණ්ඩිය' යනු, රැඟුමක් වශයෙන් ද ඇතැම් තැනෙක සඳහන් කර ඇත. එම විග්‍රහයට අනුව; දෙපා දැතට විහිදුවා දණිස් අතර පරතරය වියතක් පමණ සිටින සේ පළල් කර, දෙවැලමිට ද දණහිසට සමානව තබා ගනිමින් කරන රැඟුම වශයෙන් දක්වයි (ලියනගේ, 2000).

ඉහත අර්ථ නිරූපණ අතරින්, නිරුක්ති සහිත සිංහල ශබ්දකෝෂයෙහි දක්වා ඇති අර්ථය හැර අනෙක් සියලු ම කෝෂ ග්‍රන්ථ කර්තෘවරු මණ්ඩිය වචනය දේශීය ජන ව්‍යවහාරයෙහි නර්තන/ ශරීර ඉරියව්වක් හැඳින්වීමට යොදා ගන්නා බවට සාධක සපයයි. නිරුක්ති සහිත සිංහල ශබ්දකෝෂයෙහි දක්වා ඇති අර්ථයෙන් දේශීය නර්තන සම්ප්‍රදාය ත්‍රිත්වයේ කිසිදු තැනෙක මණ්ඩිය "රැඟුමක්" වශයෙන් භාවිත නොවේ.

මේ සෑම අවස්ථාවක දී ම 'මණ්ඩි' 'මණ්ඩිය' යන වදන් භාවිත වී ඇත. 'ඩ' අක්ෂරයට පෙර මූර්ධජ 'ණ' යෙදීමේ භාෂාත්මක ලේඛන රීතිය අනුගමනය කරමින් 'ණ'-කාරය සහිත ව ලියා දක්වා ඇත (කෝපරහේවා, 2024). එහෙත්, **නර්තන වාක් කෝෂයෙහි** 'මැන්ඩිය' ලෙස ද වදනක් ඇතුළත් කර ඇති අතර එහි අර්ථය ද පෙර දක්වා ඇති 'මණ්ඩිය' යටතේ එන කරුණු කෙරෙහි ම යොමු කරවා ඇත (දිසානායක, 2021). සුබෝච්චාරණයේ දී 'මණ්ඩිය' 'මැන්ඩිය' හෝ 'මැණ්ඩිය' වශයෙන් උච්චාරණය කිරීම සිදු වන්නට ඇති බව මහින්ද කුමාර දළුපොත මහතාගේ අදහසයි (එම්. කේ. දළුපොත, ස.සා, 05.22.2025).

### 3.2 පාෂාණ වර්ග හැඳින්වීමට 'මණ්ඩි' වචනය යෙදීම.

'මණ්ඩි පාෂාණ' නමින් හැඳින්වෙන පාෂාණ විශේෂයකි (සිංහල ශබ්දකෝෂය, 1992). වැසි වතුරෙන් ගල් හා පස් සෝදාගෙන ගොස් තැන්පත් වීමෙන් සෑදෙන පාෂාණ වර්ග මේ නමින් හැඳින්වෙයි. අවසාදිත පාෂාණ ලෙස ද මේවා දක්වාලිය හැකි ය. භූගෝල විද්‍යාවට අනුකූලව පාෂාණ බෙදෙන ප්‍රධාන වර්ග තුනකි. ඒ ආග්නේය පාෂාණ, අවසාදිත පාෂාණ, විපරීත පාෂාණ වශයෙනි (එච්. වයි. කේ. ජයවීර, ස.සා, 05.20.2025).

පෘථිවිය අභ්‍යන්තරයේ ඇති උණු වූ පාෂාණ මැග්මා හෙවත් ලාවා වශයෙන් වේ. කුස්තුර පෘථිවි ස්ථරයේ කැඩී බිඳී, පුපුරා ගිය ස්ථාන හරහා පෘථිවිය මතු පිටට පැමිණ වායුගෝලීය තත්ත්ව හමුවේ නිරාවරණයට ලක් වී ඝන ව සිසිල් වූ පසු ආග්නේය පාෂාණ නිර්මාණය වේ (එච්. වයි. කේ. ජයවීර, ස.සා, 05.20.2025).

විවිධ පීඩන, ප්‍රවේග හා බලපෑම් හේතුවෙන් ප්‍රකෘති ස්වභාවය වෙනස් වූ පාෂාණ විපරීත පාෂාණ ලෙස දක්වාලිය හැකි ය. මෙකී ආග්නේය පාෂාණ හා විපරීත පාෂාණ වර්ෂාව, සුළඟ, උෂ්ණත්වය හේතුවෙනුත් ගැටීම් ආදිය හේතුවෙනුත් ඛණ්ඩනය වීම නිසා ක්ෂයව ගොස් යම් තැනක තැන්පත්ව පීඩනයට ලක් වූ පාෂාණ අවසාදිත පාෂාණ ලෙස විග්‍රහ කළ හැකි ය (එච්. වයි. කේ. ජයවීර, ස.සා, 05.20.2025). භූ විද්‍යාත්මක හඳුන්වන තාක්ෂණික නාම සහ විග්‍රහය මෙසේ වුව ද අවසාදිත පාෂාණ දේශීය ජන ව්‍යවහාරයෙහි මණ්ඩි පාෂාණ ලෙස හැඳින්වෙයි.

ක්ෂය වී දිය වී ගොස් අවසානයෙහි රැඳුණු ඉතිරි වූ පාෂාණ යන අර්ථයෙන් දේශීය ජන ව්‍යවහාරයෙහි යන යෙදුම අවසාදිත පාෂාණ සඳහා දේශීය ජන ව්‍යවහාරයෙහි මණ්ඩි යන වචනය පූර්ව පදයක් වශයෙන් යෙදී භාවිත වී ඇති බව ඒ අනුව නිගමනය කළ හැකි වේ.

### 3.3 ප්‍රදේශාර්ථය හඟවන පදයක් ලෙස මණ්ඩි වචනය යෙදීම.

'මණ්ඩි' වචනයෙහි නිරුක්ත්‍යාර්ථ, පදාර්ථ විමර්ශනය කිරීමේ දී හඳුනා ගත් තවත් නිරුක්තියකි, ප්‍රදේශාර්ථය හැඟවීම සඳහා මෙම වචනය භාවිත වීම. අධ්‍යයනයේ පහසුව සඳහා එම කෝෂාර්ථ පහත සඳහන් පරිදි කළ හැකි වේ.

**වගු අංකය 01.** ප්‍රදේශාර්ථය හැඟවෙන නිරුක්ත්‍යාර්ථ.

| ශබ්දකෝෂය | නිරුක්ත්‍යාර්ථ |
|---|---|
| 1. ශ්‍රී සුමංගල ශබ්දකෝෂය (මණ්ඩි) | ප්‍රදේශය; පැත්ත |
| 2. ප්‍රායෝගික සිංහල ශබ්දකෝෂය මණ්ඩිය (නා.) | 1. ප්‍රදේශය, පැත්ත, පෙදෙස<br>2. ඇට වර්ග, පැළ කිරීම පිණිස කවාකාරව මඳක් උස් වන සේ සැකසූ භූමිය |
| 3. ගුණසේන සිංහල මහා අකාරාදිය මණ්ඩි | ප්‍රදේශය, පැත්ත, පළාත |
| 4. සිංහල ශබ්දකෝෂය 'මණ්ඩිය, මංඩිය (නා.) | 1. ප්‍රදේශය; පැත්ත; පෙදෙස.<br>2. (කථා) ඇට වර්ග සිටවීම පිණිස රවුම් ව මඳක් උස් වන සේ සැකසූ භූමිය. ''අර තියෙන්නේ අපේ වට්ටක්කා මණ්ඩිය යි.'' |
| 5. ශබ්දාර්ථ රත්නාකරය හෙවත් සිංහල මහා ආකාරාදිය | ප්‍රදේශය, පැත්ත |
| 6. ජනශ්‍රැති ශබ්දකෝෂය මංඩිය (ජන) | ප්‍රදේශය, ගොන්න, පෙදෙස.<br>යම් ප්‍රදේශයක කොටසක් හැඳින්වීමට යොදා ගනී. |
| 7. සරසවි සිංහල- සිංහල ශබ්දකෝෂය මණ්ඩිය (නා.) | පෙදෙස, පැත්ත, |
| 8. නිරුක්ති සහිත සිංහල ශබ්දකෝෂය මණ්ඩි (දෙ.මණ්ඩි) මණ්ඩිය | ප්‍රදේශය, කොටස, පෙදෙස, පැත්ත |

එපමණකුදු නොව, ඕනෑ ම වගාවක් සහිත ප්‍රදේශයක් හැඳින්වීමට ද යමක් වැඩි ප්‍රමාණයකින් තිබෙන කොටස හෝ ප්‍රදේශය හැඳින්වීමට ද 'මණ්ඩිය' යන වචනය කොස් මණ්ඩිය, පුවක් මණ්ඩිය, පොල් මණ්ඩිය, හේන් මණ්ඩිය, කඩ මණ්ඩිය සහ තේ මණ්ඩිය ලෙස දේශීය ජන ව්‍යවහාරයෙහි භාවිත කෙරෙන අවස්ථා ද පවත්නා බව සනාථ විය.

වැව හා බැඳුණු ප්‍රදේශාර්ථවාචී 'මණ්ඩිය' වදන භාවිතයක් ද වේ. ඉපැරණි ජනතාව ජලය ලබා ගත්තේ වැවෙනි. මේ සඳහා සුවිශේෂී තොටුපළවල් කීපයක් වෙන් කර ගෙන තිබුණි. නාන තොටෙන් පානය සඳහා ජලය ලබා ගත්තේ නැත. පානීය ජලය ලබා ගන්නා තොටෙහි පිරිසිදු බව තීරණය කරන්නේ ජලයේ වැඩී ඇති ශාක ප්‍රජාව අනුව ය. මේ තොටුපළවල් විවිධ නම්වලින් හඳුන්වයි. ඒවා මෙපරිදිය; බොරුපන් මණ්ඩිය, ඌරුවී මණ්ඩිය, තිරුවානා ගල් මණ්ඩිය, ලුණුවිල මණ්ඩිය හා විෂකුම්භණ මණ්ඩිය ආදි වශයෙනි (සූරියආරච්චි, 2021).

**ඌරුවී මණ්ඩිය :** ඌරුවී නම් මේ ගොයම් විශේෂය වැව්වල නොගැඹුරු ජලයේ හොඳින් වැවේ. කුඩාවට වී කරලක් සැදේ. මෝරන විට ම මෙම වී ඇට කරලින් ගිලිහේ. මේ ගොයමේ මූල පද්ධතිය මගින් ජලය පිරිසිදු වන බවට පැරැන්නෝ විශ්වාස කරති (සූරියආරච්චි, 2021).

**බොරුපන් මණ්ඩිය :** ඉතාමත් ඝන ව වැඩී ඇති බොරුපන් මණ්ඩියේ තොටුපළෙන් ද පානීය ජලය ලබා ගැනීමට පැරැන්නෝ කටයුතු කළහ. වැවේ බොරුපන් මණ්ඩිය තද නිල් පැහැයක් ගනී. වැව්වල සහ වගුරුවල වැවෙන මෙම කුඩා පන් ශාකයේ කඳ වටකුරු ය. මෙම ශාකය අඩි දෙකක් තුනක් පමණ උසට වැවේ. පුරුක් සහිත මෙම පන් ශාකයේ ඇතුළත බටයක් මෙන් ඇත. මෙම ශාකයේ ස්වභාවය නිසා ජලය හොඳින් පිරිසිදු කෙරෙන බව පැරැන්නන්ගේ අදහසයි (සූරියආරච්චි, 2021).

රජරට කලාපයේ සහ සත්කෝරළයේ මණ්ඩිය/මැණ්ඩිය ජන ව්‍යවහාරයේ ප්‍රදේශාර්ථය නිරූපණය කරන අවස්ථා මතු සඳහන් වන පරිදි වේ:

**ගම්මැණ්ඩිය/ ගම්මණ්ඩිය :** එනම්, ගම්මැද්දයි. ගෙවල් වහල පල දෙකකින් යුතුව, මැද මිදුලක් සහිතව වට රවුමට තනා ගන්නා සාම්ප්‍රදායික ගම්මැද්ද, ගම්මැණ්ඩිය/ ගම්මණ්ඩිය ලෙසින් හඳුන්වයි (එම්. කේ. දළුපොත, ස.සා, 05.22.2025). එක ගමේ උදවිය, මිනිසුන් ගම්මණ්ඩියේ

ඇත්තෝ, ගම්මණ්ඩියේ උන්දලා ලෙස ද එක ගමේ නෑදෑයන් ගම්මණ්ඩියේ නෑදෑ සනුහරේ ලෙස ද ව්‍යවහාර කෙරේ (එම්. කේ. දළුපොත, ස.සා, 05.22.2025).

**කමත් මණ්ඩිය :** කමත වූකලී වට වූ බිමකි. පිදුරු කළ පිටවැටියෙන් වට කොට ඇති සාම්ප්‍රදායික බිම් කමත "කමත් මණ්ඩිය" ලෙස ව්‍යවහාර කෙරෙන අවස්ථා සිංහල ජනවහරෙහි දක ගත හැකි ය. මෙම ව්‍යවහාර වෙල් කමතට හෝ ගල් කමතට භාවිත නොවේ (එම්. කේ. දළුපොත, ස.සා, 05.22.2025).

**කොළ මණ්ඩිය:** වී පාගා ගැනීමට පෙර තාවකාලිකව කමතේ රැස් කර තබා ගන්නා ගොයම ගොයම් කොළය ලෙස කමත් බසෙහි ව්‍යවහාර කෙරේ. මෙකී ගොයම් කොළ කමත වටා රැස් කර තබා ඇති විට එම වට වූ බිම් පෙදෙස "කොළ මණ්ඩිය" ලෙස හඳුන්වයි (එම්. කේ. දළුපොත, ස.සා, 05.22.2025).

**වෑ මණ්ඩිය:** ගමේ වැව වටකරේම එනම්; රවුම් හැඩයට තිබෙන විට ඒ වෑ කන්ද හා එම වටපිටාව හඳුන්වනුයේ 'වෑ මණ්ඩිය' යනුවෙනි (එම්. කේ. දළුපොත, ස.සා, 05.22.2025).

**ඕවිටි මණ්ඩිය:** කුඩා ලඳු කැලෑ එනම්; බිම සිට ඉණ මට්ටමට තරම් උස පඳුරු කැලෑ සහිත ඕවිටි සහිත ප්‍රදේශය ඕවිටි මණ්ඩිය ලෙස හැඳින්වේ. කුඹුරු සමීපයේ හෝ වෙනත් වගා බිම් ආශ්‍රිතව මෙම ඕවිටි දක ගත හැකි ය (එම්. කේ. දළුපොත, ස.සා, 05.22.2025).

**බිහි මණ්ඩිය :** ගම්මැද්දේ වී බිස්සවල් තනා තිබෙනුයේ මැද මිදුලේ කවාකාර රටාවකට ළංව පිහිටන ආකාරයට ය. එවැනි වී බිස්සවල් සහිත ප්‍රදේශය ගම්මු, "බිහි මණ්ඩිය" ලෙස හඳුන්වති (එම්. කේ. දළුපොත, ස.සා, 05.22.2025).

### 3.4 ද්‍රාවණ අවස්ථා ආශ්‍රය කර ගනිමින් මණ්ඩි වචනය යෙදීම.

මණ්ඩිය වචනය දේශීය ජන ව්‍යවහාරයෙහි යෙදෙන තවත් ආකාරයකි මේ. එනම්, යම් කිසි ද්‍රව්‍යයක අවසානයට ඉතිරි වන උකු දෙය 'මංඩි' 'මණ්ඩි' ලෙස සිංහල හා දමිළ සාමාන්‍ය ව්‍යවහාරයෙහි යෙදීමයි. වර්තමාන ව්‍යවහාරයේ දී පවා අපට මෙම භාවිතයන් හඳුනා ගත හැකි වීම සුවිශේෂී වේ. අධ්‍යයනයේ පහසුව සඳහා එම ව්‍යවහාර පහත සඳහන් පරිදි විග්‍රහ කර දක්වමු.

**වගු අංකය 02.** ද්‍රාවණ අවස්ථා ආශ්‍රය කර ගත් නිරුක්ත්‍යර්ථ.

| ශබ්දකෝෂය | නිරුක්ත්‍යර්ථ/ය |
|---|---|
| 1. **ශ්‍රී සුමංගල ශබ්දකෝෂය** - මණ්ඩි | ද්‍රවයන්හි යට මිදෙන උකු වූ දෙය. |
| 2. **සිංහල ශබ්දකෝෂය** - මණ්ඩි, මාඩි (නා.ප්‍ර.) | ද්‍රවයක ඇති ද්‍රව්‍යයන්ගෙන් යටට කිඳා බසින සැහැල්ලු කොටස, දිය තෙල් ආදි ද්‍රව තිබෙන බඳුනක පත්ලේම රැඳෙන ද්‍රව්‍ය කොටස; ද්‍රවයන්හි අඩියෙහි මිදෙන දෙය; පතුලට ම බසින රොඩු; බොර; අවපාතය. |
| 3. **ප්‍රායෝගික සිංහල ශබ්දකෝෂය** - මණ්ඩි - (නා.ප.) | ද්‍රවයක යටට හෝ උඩට වෙන් වී මිදෙන උකු කොටස |
| 4. **ශබ්දාර්ථ රත්නාකරය හෙවත් සිංහල මහා අකාරාදිය** - මණ්ඩි | රා ආදියෙහි යටට බැස මිදී තිබෙන ඝන දෙය. |
| 5. **දෙමළ - සිංහල අකාරාදිය** kz;B (මණ්ඩි) | බොර |
| 6. **ගුණසේන සිංහල මහා අකාරාදිය** - මණ්ඩි | දියාරු ගතියෙන් යුත් තෙල්, රා, ආදියෙහි යටට බැස මිදී පවත්නා කොටස. |
| 7. **ජනශ්‍රැති ශබ්දකෝෂය** - මංඩි (ජන) | ද්‍රව්‍යයක අඩියට බේරෙන කොටස්, දියර වර්ගයක අඩියේ ඉතිරි වන දෙය. |
| 8. **නිරුක්ති සහිත සිංහල ශබ්දකෝෂය** - මණ්ඩි, (දෙ. මණ්ඩි) | යම් ද්‍රව්‍යයක ඇති යටට කිඳා බසින කොටස, බොර, අවපාතය |

'තේ මංඩි/ මණ්ඩි' 'රා මංඩි/ මණ්ඩි' 'කෝපි මංඩි/ මණ්ඩි' ආදි යෙදුම් මේ කරුණ වඩාත් තහවුරු කරවාලයි. මෙලෙස වතුර හෝ වෙන යම් ද්‍රව්‍යයක මණ්ඩි යටට බැසීම, අවසාදනය

හෙවත් **sedimentation** අවස්ථාව 'මණ්ඩි බැස්ම' ලෙස හඳුන්වා ඇත (විජයතුංග, 1984). එසේ රා කර්මාන්තය ආශ්‍රිතව මණ්ඩිය හා බැඳුණු තවත් පාරිභාෂික පදයක් හඳුනා ගැනීමට හැකි වූ අතර එය ශබ්දකෝෂ කිහිපයක විස්තර කර දක්වා තිබුණේ මෙපරිද්දෙනි;

**වගු අංකය 03.** රා කර්මාන්තය ආශ්‍රිත නිරුක්ත්‍යර්ථ

| **ශබ්දකෝෂය** | **නිරුක්ත්‍යර්ථ/ය** |
|---|---|
| | |
| 1. **සිංහල ශබ්දකෝෂය**, මණ්ඩි හැළිය (කථා), (නා.) | රා පැසවීමට දමන ලොකු මුට්ටිය. |
| 2. **ප්‍රායෝගික සිංහල ශබ්දකෝෂය** (මණ්ඩි හැළිය (නා.) | රා පැසවීමට දමන ලොකු මුට්ටිය. |
| 3. **ජනශ්‍රැති ශබ්දකෝෂය** - මණ්ඩි හැළිය (ජන.) | රා පැහෙන ලෙස තැන්පත් කරන ලොකු හැළිය. මෙහි පැසුණු රා මණ්ඩි තිබෙන නිසා දමන සියලු රා ඉක්මනින් පැහේ. |

## 3.5 සමූහාර්ථයක් හඟවන පදයක් ලෙස මණ්ඩි වචනය යෙදීම.

පිරිසක්, සමූහයක් හෝ කණ්ඩායමක් හඟවන පද සමූහාර්ථවාචී පද වේ (තිලකසිරි, 2021). "මණ්ඩිය" යන වචනය ද දේශීය ජන ව්‍යවහාරයේ ඇතැම් අවස්ථාවල සමූහාර්ථවාචීව යෙදෙන අවස්ථා වේ. එකතු වෙනවා, රාශි වෙනවා යන අර්ථයෙන් "මංඩි වෙනවා" (ලියනගේ, 2000) වශයෙන් දේශීය ජන ව්‍යවහාරයෙහි යෙදෙන බව නිරීක්ෂණය විය.

1. **බූරු මණ්ඩිය** : ගමේ මිනිසුන් බිම රවුමට වාඩි වී බූරුවා ගහන තැන හෙවත් බූරුපොළ බූරු මණ්ඩිය ලෙස ද ව්‍යවහාර වේ (එම්. කේ. දළුපොත, ස.සා., 05.22.2025).
2. **මැණ්ඩියට සල්ලාප** : ගමේ මිනිසුන් ගෙදර මිදුලේ/ කමතේ/ වෙලේ/ වැව් ඉස්මත්තේ/ ඕවිටේ/ අවමඟුල් ගෙදරක/ බණ ගෙදරක මිදුලේ හෝ එළිමහනක රවුමට වට වී අල්ලාප - සල්ලාපයේ යෙදෙන අවස්ථා ජන ව්‍යවහාරයේ දී මැණ්ඩියට සල්ලාප, මණ්ඩියට සල්ලාප ලෙස ව්‍යවහාර කරති (එම්. කේ .දළුපොත, ස.සා., 05.22.2025).
3. **නාම්බන් මණ්ඩිය** : තරුණ උදවිය එකට රවුමකට සිට කථාබහේ යෙදීම, යම් කිසි කාර්යයක් සිදු කිරීම ජනවහරේ මෙලෙස හැඳින්වේ (එම්. කේ. දළුපොත, ස.සා, 05.22.2025).
4. **ළමිස්සි මණ්ඩිය** : තරුණියන් බිම රවුමට වාඩි වී කථා බහේ යෙදීම/ යමක් කිරීම/ ජන ක්‍රීඩාවක් හෝ සතුටු සාමීචියේ යෙදීමේ දී මෙම ව්‍යවහාරය යොදා ගැනේ (එම්. කේ. දළුපොත, ස.සා, 05.22.2025).
5. **හීං ගැටව් මණ්ඩිය** : කුඩා ළමෝ සාමූහිකව, කවාකාරව එක් ව ක්‍රීඩා කරන විට එකී සමූහය හැඳින්වනුයේ හීං ගැටව් මණ්ඩිය වශයෙනි (එම්. කේ. දළුපොත, ස.සා, 05.22.2025).
6. **බුලත් මණ්ඩිය** : පොළව මට්ටමේ සිට අඩි 3ක් හෝ 4ක් පමණ උසට, කවාකාරව, ගෙදර ගෙවත්තේ නිමවා ගන්නා බුලත් පන්දලම බුලත් මණ්ඩිය ලෙස ජන ව්‍යවහාරයේ පැවත එයි (එම්. කේ. දළුපොත, ස.සා, 05.22.2025).

## 3.6 ග්‍රාම නාමයක දී අපර පදයක් ලෙස මණ්ඩි වචනය යෙදීම.

යම් කිසි ගමක් තවත් ගමකින් වෙන් කර දැක්වීමට නමක් ආදියෙහි සිට ම භාවිත වෙයි. ගම් හැඳින්වීම පිණිස යෙදෙන සංඥා නාම ඒ ඒ පළාත්වලට ආවේණික භූ නිර්මාණ ලක්ෂණ, වෘක්ෂලතා සහ සත්ත්ව ජීවිතය, ආගම දහම සහ ඉතිහාසය පමණක් නොව සිංහලයාගේ චින්තන ධාරිතාව, නිර්මාණ කෞශල්‍යය සහ භාෂා නිපුණතාව ද පිළිබිඹු කරයි (ඇඳගම, 2003).

ග්‍රාම නාම පිළිබඳ නිරුක්ති සියල්ල මූලික වශයෙන් දෙයාකාර වේ:

- **පරිසරානුබද්ධ නිරුක්ති**
- **ප්‍රවාදානුබද්ධ නිරුක්ති වශයෙනි** (දිසානායක, 1985).

මෙයින් පළමු නිරුක්ති වර්ගය ස්වාභාවික සහ සංස්කෘතික වශයෙන් නැවත දෙකොටසට බෙදෙයි. ඉනුත්, ගමක නමක් නිර්මාණය කර ගැන්මෙහි දී ප්‍රමුඛත්වයෙහි ලා සලකනුයේ

ස්වාභාවික පරිසරය හා තදානුබද්ධව පවත්නා නිරුක්තිය යි. ඇතැම් විට එක ම නම අරබයා මේ දෙයාකාරයේ ම නිරුක්ති ගැමියන් අතර ප්‍රචලිත ව පවතිනු දැක ගත හැකි ය.

මණ්ඩිය යන පදය සඳහා විවිධාර්ථවත් නිරුක්ති දේශීය ජන ව්‍යවහාරයේ පවතින බව ඉහත දී සාකච්ඡාවට බඳුන් කළෙමු. ඒ අතුරෙන් සමූහාර්ථය ඉස්මතු කරන මණ්ඩිය යෙදුම අපර පදයක් ලෙස යොදා ගනිමින් ඒ ඒ ප්‍රදේශයන්හි වෘක්ෂලතා ව්‍යාප්තිය ද සලකා ඇතැම් ග්‍රාම නාම නිර්මාණය කර ගෙන ඇති බව අනාවරණය විය.

**නාගස්මණ්ඩිය** : මේ ප්‍රදේශයෙහි වූ නාගස් සමූහය නිසා මේ නම ගමට ලැබී ඇත. (රත්නපාල, 1991)

ඓතිහාසික සිද්ධියක් හෝ ජනප්‍රවාදයක් හෝ පදනම් කර ගනිමින් ඉදිරිපත් කරන නිරුක්ති "ප්‍රවාදානුබද්ධ නිරුක්ති" නම්. කිසියම් ගමක් මූලික කර ඉදිරිපත් කරන එවැනි ප්‍රවෘත්ති ඓතිහාසික පක්ෂයෙන් බලන කල සැබැවින් ම සිදු වූවක් හෝ සිදු නොවූවක් හෝ විය හැකි ය. නමුත්, මේ හැම ප්‍රවෘත්තියක් ම ඓතිහාසික සත්‍යයක් මූලාශ්‍රය කර ගත්තක් වන හෙයින් දේශීය ජන ව්‍යවහාරයෙහි එන එවැනි ප්‍රවාදානුබද්ධ නිරුක්ති ද සුවිශේෂී මෙහෙයක් ඉටු කරයි (ඇඳගම, 2003).

මණ්ඩිය යන වදන අපර පදයකට ම යෙදී නිර්මාණය වී ඇති මාවරමණ්ඩිය ග්‍රාම නාමය ද ප්‍රවාදානුබද්ධ නිරුක්ති කාණ්ඩය නියෝජනය කරන දේශීය ජන ව්‍යවහාරයක් ලෙස හඳුනා ගත හැකි වේ.

**මාවරමණ්ඩිය**: ගම්පහ දිස්ත්‍රික්කයේ බියගම මැතිවරණ කොට්ඨාසයේ පිහිටා ඇත. පෘතුගීසින් ලංකාවට පැමිණීමෙන් පසු වෙළඳාම් කටයුතු දියුණු විය. එවිට ගැල්වලින් සහ කරත්තවලින් කොළඹ වරාය දක්වා පිරිස් භාණ්ඩ ප්‍රවාහනය කළේ අද මාවරමණ්ඩිය නමින් හැඳින්වෙන කඩමණ්ඩිය හරහා ය. මේ කඩමණ්ඩිය පිහිටා තිබුණ ප්‍රදේශයේ ම මෙම භාණ්ඩ ප්‍රවාහනයේ නියැළෙන වෙළඳුන්ගේ මුදල් - හදල් කොල්ලකමින් මැරකම්, චණ්ඩිකම් කරන පිරිසක් වීලු. මැරවරමණ්ඩිය නමින් එකල බැවහරව සුබෝච්චාරණයට මාවරමණ්ඩිය ලෙස පත් වූ වග ජන ව්‍යවහාරයේ පවතී (එම්. කේ. දළුපොත, ස.සා, 05.22.2025).

මේවාට අමතරව 'මංඩිය' 'මණ්ඩිය' යන වදන් හා බැඳී පවත්නා තවත් ජන ව්‍යවහාර කිහිපයක් ද අපගේ අධ්‍යයනයේ දී හඳුනා ගැනීමට හැකි විය.

ඉරිඟු පීදෙන කාලයේ දී වැසි නොමැති වීමෙන් කරල් නිසරු වී යෑම හෙවත් නිසරු කරල් පීදීම "මංඩිවලු පීදෙනවා" (ලියනගේ, 2000) යනුවෙන් ද විවාහ වී බින්න බැසීම, විවාහක භාර්යාවගේ නිවසේ නතර වීම "මණ්ඩියට යනවා" (ලියනගේ, 2000) යැයි ද ජන ව්‍යවහාරයක් සිංහලයා අතර පවතී.

## 3.7 සමාස නාමයක් ලෙස මණ්ඩි වචනය

මණ්ඩිය යන පදය ප්‍රදේශාර්ථයෙහි යෙදෙන විට එය නාම පදයක් ලෙස භාවිත වේ. එහෙත් එය නෘත්ත, නෘත්‍ය සහ නාට්‍ය යන ක්ෂේත්‍රවල දී බොහෝ විට ක්‍රියා ස්වරූපයක් දරන බව හඳුනා ගත හැකි විය. සබරගමු නර්තන සම්ප්‍රදාය හැදෑරීමට ප්‍රවේශ වන ආධුනික ශිල්පියෙක් හෝ ශිල්පිනියක් ප්‍රථම වරට ඉදිරිපත් කෙරෙන "මණ්ඩිපද" නැටීම (රාජපක්ෂ, 2000) වැනි ඉතා දුර්ලභ අවස්ථා කිහිපයක් හැරුණු විට හැම විටක ම එය ක්‍රියා ස්වරූපයක් දරයි.

එය සමාස පදයක් ලෙස යෙදෙතත්, කිසිවිටෙක එය තද්ධිතයක් හෝ කෘදන්තයක් ලෙස වර නො නැඟේ. බැලූ බැල්මට තද්ධිත හා කෘදන්ත ස්වභාවයක් "මණ්ඩි" යන වදනෙහි දක්නට ලැබුණත්, එය කිසිදු විටෙක නාම මූල ස්වරූපයකට හෝ ක්‍රියා මූල ස්වරූපයකට ප්‍රත්‍යයක් එකතු වීමෙන් සෑදෙන පදයක් ලෙස නො යෙදේ.

ගීමණ්ඩිය, පූර්ණමණ්ඩිය, බරමණ්ඩිය ආදි පදවල දී ද ගම්මණ්ඩිය, කඩමණ්ඩිය ආදි ඉහතින් සඳහන් කළ ප්‍රදේශාර්ථයේ පදවල දී ද මෙම සමාස ස්වරූපය ඉතා හොඳින් කැපී පෙනේ. ඊට හේතුව එය වර නැඟෙන්නේ නාම ස්වරූපයකින් වීම නිසා ය.

## 4. නිගමනය හා සමාලෝචනය

දේශීය ජන ව්‍යවහාරයෙහි භාවිත "මණ්ඩිය" යන වදනෙහි නිරුක්ත්‍යාර්ථ සහ භාවිතාර්ථ රාශියකි. "මණ්ඩිය" යන වදනෙහි නිරුක්ත්‍යාර්ථ විමසීමේ දී, නර්තන ශරීර ඉරියව්වක් හැඳින්වීම සඳහා මණ්ඩිය යන වචනය යෙදීම මෙන් ම ප්‍රදේශාර්ථය හඟවන පදයක් ලෙසත් ද්‍රාවණ හෝ ද්‍රවමය

අවස්ථාවන්හි පහළට කිඳා බසින ද්‍රව්‍ය ආශ්‍රය කර ගනිමිනුත් මණ්ඩි/ මණ්ඩිය යන වචනය යෙදීම හඳුනා ගත හැකි විය. දේශීය ජන ව්‍යවහාරයෙහි භාවිත "මණ්ඩිය" පිළිබඳ නිරුක්ත්‍යර්ථ සහ භාවිතාර්ථ විමසමින් සිදු කරන ලද මෙම අධ්‍යයනය මගින්, එම වදනෙහි බහු - අර්ථවත් බව සහ එය දේශීය සංස්කෘතික හා සමාජීය වපසරිය තුළ දරන කේන්ද්‍රීය භූමිකාව පැහැදිලිව තහවුරු විය.

"මණ්ඩිය" යන වදන දමිළ භාෂාවේ 'මණ්ඩි' (දණ නැමීම/ වාඩි වීම) යන පදයෙන් බිඳී සිංහලයට පැමිණ ඇත. කෙසේ වෙතත්, සිංහල ජන ව්‍යවහාරය තුළ දී එම මූලික අර්ථය පුළුල් වී 'කිඳා බැසීම' 'රැස් වීම' සහ 'කවාකාරව පිහිටීම' යන අනුරූපී අර්ථ ගොඩනඟා ගැනීමට සමත් වී ඇත. අධ්‍යයනය මගින් හඳුනා ගත් තේමා හය ඔස්සේ මෙම වදන නර්තනය, භූගෝල විද්‍යාව, කෘෂිකර්මය, ද්‍රව විද්‍යාව, සමූහාර්ථය සහ ග්‍රාම නාමකරණය වැනි ක්ෂේත්‍ර ගණනාවක යෙදීම තුළින්, "මණ්ඩිය" සිංහල ජන ව්‍යවහාරයේ අතිශය බහු - අර්ථවත් නාමපදයක් බව නිගමනය කළ හැකි ය.

'මණ්ඩිය' 'මංඩිය' 'මැණ්ඩිය' වැනි ලේඛන සහ උච්චාරණ විචල්‍යතා පැවතීම, මෙම වචනය දේශීය භාෂා ව්‍යවහාරයේ සුඛෝච්චාරණයට සහ කලාපීය උච්චාරණ රටාවන්ට අනුගතව විකාශනය වී ඇති බවට සාධක සපයයි. එසේම, දේශීය නර්තන සම්ප්‍රදාය ත්‍රිත්වයේ ම මූලික ඉරියව්ව "මණ්ඩිය" ලෙස හැඳින්වීම, එම වචනය දේශීය නර්තන කලාවේ පදනම හා සම්බන්ධ වූ පාරිභාෂික පදයක් බවට පත් කරන බව වඩාත් තහවුරු විය.

ප්‍රදේශාර්ථය සහ සමූහාර්ථය යටතේ "මණ්ඩිය" යෙදෙන අවස්ථා අනුව, සිංහලයාගේ ජන ව්‍යවහාරය තුළ කවාකාරව/ රවුමට පිහිටි ස්ථානය හෝ එක්රැස් වූ පිරිස යන අර්ථ මගින් සාමූහිකත්වය සහ සමාජ කේන්ද්‍රීයභාව සංකේතවත් කිරීමටත්. "මණ්ඩි පාෂාණ" (අවසාදිත පාෂාණ) සහ ද්‍රවවල "මණ්ඩි බැසීම" (අවසාදනය) යන යෙදුම් තුළින්, දේශීය ජනතාව තුළ ස්වාභාවික ක්‍රියාවලීන් (භූ විද්‍යාව සහ භෞතික විද්‍යාව) පිළිබඳ සාම්ප්‍රදායික විද්‍යාත්මක අවබෝධයක් පැවති බවත්, එම සංකල්ප සන්නිවේදනය සඳහා "මණ්ඩිය" වදන භාවිත කර ඇති බවත් නිගමනය කළ හැකි ය.

මෙම අධ්‍යයනය මගින් සමාස නාමයක් ලෙස "මණ්ඩිය" යන වචනය අර්ථ දක්වාලිය හැකි වීම මෙන් ම "මණ්ඩිය" යන වචනය හා බැඳි විසිරී පැවති ජන ව්‍යවහාර සමුච්චයක් එකතු කිරීම, වර්ගීකරණය කිරීම සහ විග්‍රහ කිරීම සාර්ථකව සිදු කරමින්, ඒ පිළිබඳව පැවති පර්යේෂණමය හිඩැස සපුරාලන ලදි. මින් ඉදිරියට මෙම යෙදුම අධ්‍යයන ක්ෂේත්‍ර ගණනාවක් සඳහා වැදගත් මූලාශ්‍රයක් වනු ඇත.

**පිළිගැන්වීම**
මෙම පර්යේෂණය සඳහා RC/URG/HSS/2014/03 දරන ප්‍රදාන අංකය යටතේ මූල්‍ය අනුග්‍රහය දැක්වූ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පර්යේෂණ ප්‍රදාන සභාව වෙත කර්තෘවරු සිය කෘතඥතාව පළ කර සිටිති.

## 5. ආශ්‍රිත ග්‍රන්ථ

ඇඳගම, පී. (2003). *සබරගමුව වංශකථාව.* සබරගමුව පළාත් සභාව.
කරුණාතිලක, ඩබ්ලිව්. එස්. (2022). *දෙමළ - සිංහල අකාරාදිය* (6 මුද්‍රණය). සී/ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම.

කෝට්ටගොඩ, ජේ. (2011). *පහතරට රංග කලාවේ ලේඛන රීතිය.* ජේ. කේ. පබ්ලිකේෂන්ස්.

කෝපරහේවා, එස්. (2024). *සිංහල අක්ෂර වින්‍යාස අකාරාදිය.* සී/ස. ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම.

තිලකසිරි, ඇස්. (2001). *සිංහල ව්‍යාකරණ විදි.* රත්න ප්‍රකාශකයෝ.

දිසානායක, ජේ. බී. (2000). *සිංහල ජන වහර.* ඇස්. ගොඩගේ සහ සමාගම.

දිසානායක, එම්. (2021). *නර්තන වාක්කෝෂය.* සී/ස. ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම.

ධර්මබන්ධු, ටී.ඇස්. (1962). *ගුණසේන සිංහල මහා අකාරාදිය* (දෙවැනි භාගය). ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

පීරිස්, කේ. එන්. ඩී. (2011). *සිංහල - දෙමළ ශබ්දකෝෂය.* (3 මුද්‍රණය). ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම.

රත්නපාල, ඊ. ඇම්. (1991). *ජන ජීවිතය ජනශ්‍රැතිය හා රයිගම.* ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

රත්නපාල, එන්. (2010). *ජනශ්‍රැති විද්‍යාව.* ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

රාජපක්ෂ, ඇස්. (2000). සබරගමු නර්තන කලාව. ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ලියනගේ, ඇස්. (2000). *ජනශ්‍රැති ශබ්දකෝෂය.* සිරිලිය ප්‍රකාශකයෝ.

විජයතුංග, එච්. (1984). *ප්‍රායෝගික සිංහල ශබ්දකෝෂය* (දෙවැනි භාගය). සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය.

විජේසේකර, පී. ඩී. (2019). *අභිමුඛ සම්මුඛ සාකච්ඡාව [FACE TO FACE INTERVIEW].* සංඝසුමන හිමි, පින්නවල සහ විජිතධම්ම හිමි, මැදගම්පිටියේ (සංස්.), *මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පර්යේෂණ වාක්කෝෂය* (පළමු වෙළුම, 20 - 23 පිටු). බහුශික්ෂණීය පර්යේෂණ මධ්‍යස්ථානය, මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

ශ්‍රී රේවත හිමි, බෝරුග්ගමුවේ. (2001). *ශබ්දාර්ථ රත්නාකරය හෙවත් සිංහල මහා අකාරාදිය.* චතුර මුද්‍රණාලය.

සන්නස්ගල, පී. (1992). *සිංහල ශබ්දකෝෂය.* (19 කාණ්ඩය, 39 වන භාගය). සංස්කෘතික දෙපාර්තමේන්තුව.

සූරියආරච්චි, ආර්.එස්.කේ. (2021, අප්‍රේල් 24). අපේ පැරැන්නන් ජලය පිරිසුදු කර ගත් හැටි. *ඉරිදා ලංකාදීප*, 12 පිටුව.

සෝරත, වැලිවිටියේ. (1970). *ශ්‍රී සුමංගල ශබ්දකෝෂය.* අභය ප්‍රකාශකයෝ.

හෙට්ටිහේවා, පී. සහ ජයමාන්න, පර්සි. (සංස්.), (2020). *සරසවි සිංහල - සිංහල ශබ්දකෝෂය* (අටවන මුද්‍රණය, 944 පිටුව). සරසවි ප්‍රකාශකයෝ.

Vatsyayan, K. (1992). *Indian Classical Dance.* Publications Division, Ministry of Information and Broadcasting, Gov. of India.

ඡායාරූපය- සටහන, *"සභා" 2025,* by H. Sameera Harshana, 2025, [Photograph]. Harshana Sameera Photography

https://web.facebook.com/photo/?fbid=1295656559235209&set=pcb.1295678035899728 Copyright [2025] by [Harshana Sameera Photography]